සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

| මගේ අංකය<br>**எனது இல**<br>**My No** | DSD/HO/02/Pen/Com | ඔබේ අංකය<br>**உமது இல**<br>**Your No** | ............................................ | දිනය<br>**திகதி**<br>**Date** | 2025.09.25 |
|---|---|---|---|---|---|

සියලුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>විශ්‍රාම වැටුප් විෂයභාර නිලධාරීන් දැනුවත් කිරීම.</u>**

මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන් බොහෝ දෙනෙකු මේ වන විට විශ්‍රාම වයස සම්පූර්ණ වීම මත හා වෛකල්පිත වයස සම්පූර්ණ වීම මත විශ්‍රාම යමින් සිටී.

02. මෙම නිලධාරීන්ගේ විශ්‍රාම ගොනු පිළියෙළ කර දිස්ත්‍රික් කාර්යාල මගින් ප්‍රධාන කාර්යාලයට යොමු කිරීම සිදුවන අතර එම ගොනුවල පවතින අඩුපාඩු හේතුවෙන් නැවත දිස්ත්‍රික් කාර්යාල වෙත ගොනුව යොමුකිරීම හෝ අඩුපාඩු දැන්වීමෙන් පසු ඒවා නිවැරදි කර එවන තෙක් විශාල කාලයක්, ශ්‍රමයක්, වියදමක් දැරීමට සිදුවේ. ඒ හේතුව මත විශ්‍රාම වැටුප ලබාගැනීමට නිලධාරීන්ට බොහෝ කාලයක් බලා සිටීමට සිදුවී ඇත.

03. එබැවින් එවැනි අඩුපාඩු අවම කරගැනීම අරමුණු කරගෙන දිස්ත්‍රික් කාර්යාලවල විශ්‍රාම විෂය භාර කළමණාකරු හා සමෘද්ධි සංවර්ධන නිලධාරි/ සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමට තීරණය කර ඇත.

04. ඒ අනුව එම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025.10.02 දින පෙ.ව.9.30ට සිංහල මාධ්‍ය නිලධාරීන්ද, 2025.10.09 දින පෙ.ව.9.30ට දමිල මාධ්‍ය නිලධාරීන්ද සහභාගි කරවීමට පියවර ගන්නා මෙන් මෙයින් දන්වා සිටිමි.පැමිණෙන සියලු නිලධාරීන් විසින් තමන් වෙත ලැබී ඇති විශ්‍රාම ගොනුවක් හෝ ගොනු පිටපතක් රුගෙන එන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලෙසද දන්වමි.

05. මෙහිදී මේ වන විට මෙම විෂය භාරව කටයුතු කරන නිලධාරීන් විශ්‍රාම යාමට ආසන්න අය වේ නම් ඉදිරි වසර 5ක්වත් මෙම විෂයට අදාල කටයුතු කලහැකි සුදුසු නිලධාරියෙකු ද සහභාගි කරවීමට පියවර ගන්නා ලෙසද තවදුරටත් දන්වා සිටිමි.

ලේඛා ගීතාංජලී පෙරේරා,
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පාලන),
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

**1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |